ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න.
http://iscolee.blogspot.com/

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
# Sabaragamuwa Provincial Department of Education

පළමු වාර පරීක්ෂණය 2016
முதலாம் தவணைப் பரீட்சை 2016
**First Term Test 2016**

**6 ශ්‍රේණිය**
**தரம் 6**
**Grade 6**

***ගණිතය***
***கணிதம்***
***Mathematics***

***පැය දෙකයි***
***இரண்டு மணித்தியாலம்***
***Two hours***

**නම /විභාග අංකය:.............................................................................................. පන්තිය: ..........................**

## I කොටස

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**


(01) සුළු කරන්න

  74
 -53

(02) මෙම කෝණ අතරින් සෘජු කෝණය තෝරා යටින් ඉරක් අඳින්න.





(03) මෙම ගණක රාමුවෙන් නිරූපණය වන සංඛ්‍යාව ලියන්න.




(04) ***75*** යන සංඛ්‍යාව ආසන්න 10 ට වටයන්න.

(05)





A සහ B ලෙස ඉහත ලකුණුකර ඇති සංඛ්‍යා දෙක “<” සංකේතය යොදා ලියන්න.

(06) 3 253 020 178 මෙම සංඛ්‍යාව කියවන ආකාරය අකුරින් ලියන්න.

(07) චතුර රූපවාහිණී වැඩසටහනක් ප.ව. 4.45 සිට ප.ව. 5.10 තෙක් නැරඹුවේ නම් ඔහු රූපවාහිණිය නැරඹූ කාලය කොපමණද?

(08)





රූපයේ දැක්වෙන වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යයක් නම් කරන්න.

(09)

$$\begin{array}{r} \square 7 \\ \times\ 3\ 0 \\ \hline 1\ 7\ 1\ 0 \\ \hline \end{array}$$

හිස් තැනට ගැලපෙන අගය සොයන්න.


(10)



මෙම මාළු ටැංකියේ තිබෙන සිරස් දාර ගණන කීයද?

(11) 1948 පෙබරවාරි මස හතර වන දින ශ්‍රී ලංකාවට නිදහස ලැබුණි. එම දිනය සම්මත ආකාරයෙන් ලියා දක්වන්න.

(12)





රූපය ඇසුරින් හිස්තැන් සම්පූර්ණ කරන්න

(i) ගණිතාගාරයට..................... දිශාවෙන් විද්‍යාගාරය පිහිටා ඇත.

(ii) ගණිතාගාරයේ සිට බලන විට .................. දිශාවෙන් කාර්යාලය පිහිටා ඇත.


(13)



මෙම සම්පූර්ණ වෘත්තයෙහි වර්ගඵලය අඳුරු කළ කොටස මෙන් කී ගුණයක් වේදැයි නිමානය කරන්න.

(14) ප.ව. 2.00 ට මිනිත්තු කටුව හා පැය කටුව අතර කෝණය හැඳින්වෙන නම කුමක්ද?

(15) සිහින් කම්බියක් මගින් රූපයේ පෙනෙන ආකාරයට චතුරස්‍රයක් සාදන ලදී. එය සමචතුරස්‍රයක් ආකාරයට සකස් කරනු ලැබුවේ නම් එක පාදයක දිග කොපමණද?




(16) මිනිත්තු 240 ක් පැය කීයක් වේද?

(17) "අට මිලියන හත්සිය දහස් පනහ" . සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

(18) පේර ගෙඩි 5 ක මිල රු. 40.00 ක් නම් පේර ගෙඩි 12 ක මිල කීයද?

(19) චතුරි සංඛ්‍යාවක් සිතූ විට එය ආසන්න 10 ට වැටයීමෙන් 80 ලැබුණි. ඇය සිතූ සංඛ්‍යාව විය හැකි

(i) කුඩාම අගය කීයද?

(ii) විශාලම අගය කීයද?

(20) චොකලට් කර්මාන්ත ශාලාවක තත්පර 20 කදී චොකලට් 05 ක් නිපදවයි නම් එවැනි චොකලට් 30 ක් නිපදවීමට ගත වන කාලය මිනිත්තු කීයද?

ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න.
http://iscolee.blogspot.com/

## II කොටස

❖ **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**


(01) a) හිස්තැන් සම්පූර්ණ කරන්න

| තත්පර | මිනිත්තු | පැය |
|---|---|---|
| 1800 | 30 | $\frac{1}{2}$ |
| I ………………. | II ………………. | $1\frac{1}{2}$ |
| III ……………... | 15 | $\frac{1}{4}$ |
| 9000 | 150 | IV ………………. |

(ල. 04)

b) පෙ.ව. 10.30 ට කොළඹින් මාතර බලායන බස් රථයක් සඳහා ගමනට ගතවූ කාලය පැය 03 මිනිත්තු 20 කි. බසය මාතරට ලඟා වූයේ කීයටද? (ල. 04)

c)




i) මාලා සහ කමලා අතරින් වැඩිමහල් වන්නේ කවුරුන්ද? (ල. 01)

ii) කමලාගේ දැන් වයස කීයද? (ල. 01)

iii) මාලාගේ වයස අවුː 25 ක් වන විට කමලාගේ වයස කීයද? (ල. 02)

(02) a) 52192048

i) මෙම සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න. (ල. 01)

ii) 9 සංඛ්‍යාව පිහිටි කලාපය කුමක්ද? (ල. 01)

iii) 9 න් නිරූපණය වන අගය සොයන්න. (ල. 01)

iv) ඉහත සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න. (ල. 01)

b) කමල්ට වෙළඳසැලෙන් දිනකට ආදායම පහත දැක්වෙයි.

| | |
|---|---|
| පළතුරු විකිණීමෙන් | රු 4500 |
| එළවළු විකිණීමෙන් | රු 6000 |
| සහල් විකිණීමෙන් | රු 12250 |
| සීනි විකිණීමෙන් | රු 8000 |

i) ඔහුට වෙළඳ සැලෙන් දිනකට ලැබෙන මුළු ආදායම කීයද? (ල. 03)

ii) එදින ඔහු සහල් විකිණීමෙන් ලද ආදායමට පළතුරු විකිණීමෙන් ලද ආදායමට වඩා කොපමණ වැඩිද? (ල. 02)

(03) a) සංඛ්‍යා රේඛාවක් ඇඳ එහි -5 සිට +8 තෙක් සංඛ්‍යා ලකුණු කරන්න. (ල. 04)

b) එම නිඛිල සංඛ්‍යා දෙක අතර ඇති සියළුම නිඛිල ලියන්න. (ල. 04)

c) “ < “ හෝ “>” හෝ “=” ලකුණු නිවැරදිව යොදා ගනිමින් හිස්තැන් සම්පූර්ණ කරන්න.


i. (-5) ……….. (+5)

ii. (0) ………...(+3)

iii.(-3) ………...(-4)

iv.(-6) ………..(-6) (ල. 04)

(04) a)





මෙම රූපයේ සටහන් කර ඇති 1,2,3,4,5 අංක වලින් නිරූපණය වන කෝණ නම් කරන්න.

1. ………………………….
2. ………………………….
3. ………………………….
4. ………………………….
5. ………………………….

b) ශිෂ්‍යභට කඳවුරක ඉලක්කයට වෙඩි තැබීමේ තරගයක පුවරුව සකසා තිබුණේ වෘත්තාකාර හැඩයකිනි. වෘත්තය මත ලක්ෂ්‍යයකට වෙඩි වැදුනහොත් ලකුණු 05 ක්ද, වෘත්තය ඇතුලත ඉලක්කයට වෙඩි වැදුනහොත් ලකුණු 10 ක්ද, වෘත්තය ඇතුලත වෙනත් ලක්ෂ්‍යයකට වෙඩි වැදුනහොත් ලකුණු 03 ක්ද ලබා දේ.

තරගයට සහභාගී වූ සිසුන් කණ්ඩායමේ සිසුන් වෙඩි තැබූ ආකාරය රූප සටහනේ දැක්වේ.




(i) ලකුණු 10 ලබා ගත් සිසුවා කවුද?


(ii) ලකුණු 03ක් ලබා ගත් සිසුන් කවුරුන්ද?

(iii) ලකුණු නොලැබූ සිසුන් කවුරුන්ද?

(iv) කණ්ඩායම ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව කීයද?

(v) මෙම සෑම සිසුවෙකුටම අවස්ථා තුනක් ලබා දුනි නම් ලීලාට ලබා ගත හැකි උපරිම ලකුණු ගණන කීයද?

(05)




ඉහත දැක්වෙන්නේ නිමල්ගේ ගෙවත්තේ පිහිටි A නම් ස්ථානයක සිට බලන විට උදැසන දර්ශණයකි. නිමල්ගේ පියා අඹ ගස යට වාඩිවී සිටී. නැගෙනහිර දිශාව සූර්යයා මගින් පෙන්නුම් කර තිබේ.

(i) A ස්ථානයට උතුරින් වාඩි වී සිටින්නේ කවුද?
(ii) නිමල්ට කුමණ දිශාවෙන් පාපැදිය තිබේද?
(iii) පොල් ගස තිබෙන්නේ නිමල්ට කුමන දිශාවෙන්ද?
(iv) නිමල්ට නිරිත දිශාවෙන් තිබෙන්නේ කුමක්ද?
(v) අලියා සිටින දිශාවෙන් පාපැදිය තිබෙන දිශාවත් අතර කෝණය කුමක්ද?
(vi) ගස යට සිටින නිමල්ගේ පියාට නිමල් පෙනෙන්නේ කුමන දිශාවෙන්ද?

(ල. 2x6=12)

***


සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
පළමු වාර පරීක්ෂණය - 2016

**6 ශ්‍රේණිය - ගණිතය I-II**

ලකුණු දීමේ පටිපාටිය.

| ප්‍රශ්න අංකය | විස්තරය | ලකුණු | වෙනත් |
|---|---|---|---|
| 01 | 21 | | |
| 02 | C | | |
| 03 | 2530 | | |
| 04 | 80 | | |
| 05 | A<B | | |
| 06 | තුන් බිලියන දෙසිය පනස්තුන් මිලියන විසි දහස් එකසිය හැත්තෑ අට | | |
| 07 | මිනිත්තු 25 | 02 | 5.10<br>-4.45 අඩු කිරීම දක්වා ඇත්නම් ල. 01 |
| 08 | D | | |
| 09 | 5 | | |
| 10 | 4 | | |
| 11 | 1948.02.04 | | |
| 12 | (i) බටහිර (ii) නිරිත | | |
| 13 | 6 ගුණයක් | | |
| 14 | සුළු කෝණය හෝ පරාවර්තන කෝණය | | |
| 15 | 3+4+6+7=20 cm<br>20/4= 5cm | 01<br>01 | |
| 16 | 240/60 = 4 පැය 4කි | | |
| 17 | 8 700 050 | | |
| 18 | පේර ගෙඩි 1 ක මිල = රු 40/5 = රු 8<br>පේර ගෙඩි 12 ක මිල = රු 8 x 12 = රු 96 | 01<br>01 | |
| 19 | (i) 75 (ii) 84 | | |
| 20 | චොකලට් 1 ක් නිපදවීමට ගතවන කාලය = 20/5 = තත් 4<br>චොකලට් 30 ක් නිපදවීමට ගතවන කාලය = 4x30 = තත් 120<br>=මිනිත්තු 2 | 01<br>01 | |

# II - කොටස

| ප්‍රශ්න අංකය | | | විස්තරය | ලකුණු | වෙනත් |
|---|---|---|---|---|---|
| (01) | (a) | i) | තත්පර 5400 | 01 | |
| | | ii) | මි. 90 | 01 | |
| | | iii) | තත්පර 900 | 01 | |
| | | iv) | පැය 2 1/2 | 01 | |
| | (b) | i) | ප.ව. 1.50 | 04 | |
| | (c) | i) | කමලා | 01 | |
| | | ii) | අවු 35 | 01 | |
| | | iii) | අවු 45 | 02 | |
| (02) | (a) | (i) | 52 192 248 | 02 | |
| | | (ii) | දහස් කලාපය | 01 | |
| | | (iii) | 90 000 | 02 | |
| | | (iv) | පනස් දෙමිලියන එකසිය අනූ දෙදහස් හතලිස් අට | 02 | |
| | (b) | (i) | රු 30 750 | 03 | |
| | | (ii) | රු 12250 - 4500 = රු 7750 | 02 | |
| | | | | | |
| (03) | (a) | (i) |   | 04 | |
| | (b) | (i) | -4,-3,-2,-1,0,1,2,3,4,5,6,7 | 04 | |
| | (c) | (i) | (-5) < +5 | 01 | |
| | | (ii) | 0 < 3 | 01 | |
| | | (iii) | (-3) > (-4) | 01 | |
| | | (iv) | (-6)= (-6) | 01 | |
| (04) | (a) | (i) | මහා කෝණය | 01 | |
| | | (ii) | සෘජු කෝණය | 01 | |
| | | (iii) | පරාවර්තන කෝණය | 01 | |
| | | (iv) | සුළු කෝණය | 01 | |
| | | (v) | සරළ කෝණය | 01 | |
| | (b) | (i) | මාලා | 01 | |
| | | (ii) | රාණි, සුරාජ් | 01 | |
| | | (iii) | ලාල්,නාමල් | 01 | |
| | | (iv) | 10+3+3+5+5=16 | 01 | |
| | | (v) | 25 | 01 | |
| (05) | | (i) | අඹ ගස | 02 | |
| | | (ii) | වයඹ දිශාවෙන් | 02 | |
| | | (iii) | දකුණු දිශාවෙන් | 02 | |
| | | (iv) | ගේට්ටුව | 02 | |
| | | (v) | සෘජු කෝණය | 02 | |
| | | (vi) | දකුණු දිශාවෙන් | 02 | |
| | | | | | |